# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2487/32 - 2026 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2026.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : DEV/LND/02/ACQUI/05-14.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාවන් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්/පරවශතාවන්ගේ විස්තර:-*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවැද්දුව බටහිර ග්‍රාම නිලධාරි වසමේ, අපරැක්ක ගමේ පිහිටි මු.පි.මාර 2865 හි කැබලි අංක 1-6 දරන ඉඩම් කොටස් (ප්‍රමාණය හෙක්ටයාර් 0.0735 ක් පමණ) :

01. කැබලි අංක **01**
ඉඩමේ නම: බදුවත්ත; විස්තරය: ගෙවත්ත, වයස අවු. 25-30 ක් පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්. 0.0092.

02. කැබලි අංක **02**
ඉඩමේ නම: බදුවත්ත; විස්තරය: මාර්ගය; ප්‍රමාණය: හෙක්. 0.0306.

03. කැබලි අංක **03**
ඉඩමේ නම: බදුවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0057.

04. කැබලි අංක **04**
ඉඩමේ නම: බදුවත්ත; විස්තරය: මාර්ගය; ප්‍රමාණය: හෙක්. 0.0013.

05. කැබලි අංක **05**
ඉඩමේ නම: බදුවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0032.

06. කැබලි අංක **06**
ඉඩමේ නම: බදුවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0235.

ඉහත සඳහන් ඉඩම්වලට/පරවශතාවයන්ට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 ජූනි මස 29 වැනි දින පෙ. ව. 10.00 ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026 ජූනි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ඩබ්. පී. ශානිකා අයි. පෙරේරා,**
ප්‍රාදේශීය ලේකම්/අත්කර ගැනීමේ නිලධාරි,
දෙවිනුවර.

2026 අප්‍රේල් මස 29 වැනි දින,
දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0033

1A - G 046738 - 31 (2026/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*